// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2339/31 - 2023 ජූලි මස 07 වැනි සිකුරාදා - 2023.07.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී-බී 3/2021 (II)

### 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත

2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 27, 36, 37, 39, 40 සහ 64 වන වගන්ති සමග කියවිය යුතු ඒ පනතේ 71 වන වගන්තිය යටතේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව සහ අදාළ නියාමන අධිකාරීන් විමසා, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

රනිල් වික්‍රමසිංහ,<br>ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය.

කොළඹ දී ය.

**නියෝග**

1. මේ නියෝග 2023 අංක 1 දරන කොළඹ වරාය නගරය (ව්‍යාපාර කටයුතුවල නිරත වන බලයලත් තැනැත්තන්) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

**I වන කොටස**

**බලයලත් තැනැත්තකු විසින් ගෙවිය යුතු ලාභාංශ හෝ වෙනත් මූල්‍ය ප්‍රතිලාභ**

2. පනතේ 27 වන වගන්තියේ (5) වන උපවගන්තියේ සඳහන් තැනැත්තකු හෝ සමාගමක් විසින් ඒ උපවගන්තිය යටතේ වූ ආයෝජනයේ කොටසක් සංයුක්ත කරන්නා වූ ආයෝජනය මත වන ලාභාංශය හෝ වෙනත් මූල්‍ය ප්‍රතිලාභ, ශ්‍රී ලංකා රුපියල්වලින් හැර නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් ආයෝජකයා වෙත ගෙවනු ලැබිය යුතු ය.

3. පනතේ 39 වන වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් තැනැත්තකු හෝ සමාගමක් වෙත, අලෙවි කළ හැකි ඉඩම් බද්දට දී ඇති අවස්ථාවක දී සහ බද්ද වෙනුවෙන් ගෙවීම සිදු කරන ලද දිනයේ සිට අවුරුදු පහක කාලයක් ඇතුළත ආයෝජකයාට ලාභාංශයක් හෝ වෙනත් යම් මූල්‍ය ප්‍රතිලාභයක් උපචිතවන අවස්ථාවක දී, ඒ ලාභාංශය හෝ වෙනත් මූල්‍ය ප්‍රතිලාභය ඒ ආයෝජකයා නමින් බලපත්‍රලාභී වාණිජ බැංකුවක පවත්වාගෙන යන ඒ ආයෝජකයාගේ නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

## II වන කොටස

### ශ්‍රී ලංකා රුපියල්, නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල්වලට පරිවර්තනය කිරීම

4. කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට ව්‍යාපාර කටයුතුවල නිරතවන බලයලත් තැනැත්තකු විසින් කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ දී ශ්‍රී ලංකාවේ පුරවැසියකුට හෝ වාසිකයකුට ඒ බලයලත් තැනැත්තා විසින් සපයනු ලබන යම් භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන්, පහත සඳහන් කොන්දේසිවලට යටත්ව, ශ්‍රී ලංකා රුපියල්වලින් ගෙවීම් භාර ගැනීම කළ හැකි ය :

(අ) ඒ බලයලත් තැනැත්තා විසින් එපරිදි භාරගන්නා යම් මුදල් ප්‍රමාණයක් බලපත්‍රලාභී වාණිජ බැංකුවක පවත්වාගෙන යනු ලබන ශ්‍රී ලංකා රුපියල් ගිණුමක තැන්පත් කරනු ලැබිය යුතු ය ;

(ආ) මේ නියෝගය යටතේ ඒ බලයලත් තැනැත්තා විසින් ලබාගත් ශ්‍රී ලංකා රුපියල්, ඒ බලයලත් තැනැත්තා විසින් ස්වකීය සාමාන්‍ය ව්‍යාපාර කටයුතු කරගෙන යාමේ දී භාවිත කරනු ලැබිය හැකිය ; සහ

(ඇ) (අ) ඡේදයේ සඳහන් මුදල බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හරහා පමණක්, නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකට පරිවර්තනය කරනු ලැබිය හැකි ය.

## III වන කොටස

### බලයලත් තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවේ පුරවැසියකු හෝ වාසිකයකු සමග ව්‍යාපාර කටයුතුවල නිරතවීම

5. පනතේ 37 වන වගන්තියේ (1) වන උපවගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකාව තුළ කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශයෙන් පිටත ව්‍යාපාර කටයුතුවල නිරත ශ්‍රී ලංකාවේ පුරවැසියකු හෝ වාසිකයකු සමඟ ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර කටයුතුවල නිරතවීමට අදහස් කරන යම් බලයලත් තැනැත්තකු විසින්, ඒ කාර්යය සඳහා කොමිෂන් සභාව වෙත ඉල්ලීමක් කළ යුතු ය.

6. 5 වන නියෝගය යටතේ ඉල්ලීමක් ලැබීමෙන් පසුව, කොමිෂන් සභාව විසින්, ඒ ඉල්ලීමේ ඇතුළත් කරුණු සලකා බැලීමෙන් පසුව, ඒ ව්‍යාපාර කටයුතුවල නිරතවීමට ඒ බලයලත් තැනැත්තාට ලිඛිතව බලය ලබා දිය හැකි ය; නැතහොත් සඳහන් කරනු ලැබිය යුතු හේතු මත ඒ බලය ලබාදීම ප්‍රතික්ෂේප කළ හැකි ය.

7. 6 වන නියෝගය යටතේ බලය ලබා දී ඇත්තේ යම් බලයලත් තැනැත්තකුට ද, ඒ බලයලත් තැනැත්තා විසින් -

(අ) හුදෙක් ශ්‍රී ලංකාව තුළ, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශයෙන් පිටත ව්‍යාපාර කටයුතුවල නිරත ශ්‍රී ලංකාවේ පුරවැසියකු හෝ වාසිකයකු සමඟ ව්‍යාපාර කටයුතු කරගෙන යාමේ කාර්යය සඳහා පමණක් ව්‍යාපාර කටයුතුවල නොයෙදිය යුතු ය; සහ

(ආ) තම ව්‍යාපාරයේ මුළු ආදායමෙන් භාගයකට වැඩි ප්‍රමාණයක්, ශ්‍රී ලංකාව තුළ, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශයෙන් පිටත ව්‍යාපාර කටයුතුවල නිරත ශ්‍රී ලංකාවේ පුරවැසියකු හෝ වාසිකයකු සමග නොවන, තැනැත්තන් සමග කරන ව්‍යාපාර කටයුතුවලින් උත්පාදනය කළ යුතු ය.

8. 6 වන නියෝගය යටතේ නිකුත් කරන ලද සෑම බලය ලබාදීමක් ම එහි නිශ්චිතව දක්වා ඇති නියමවලට සහ කොන්දේසිවලට යටත් විය යුතු ය.

9. 6 වන නියෝගය යටතේ බලය ලබා දී ඇත්තේ යම් බලයලත් තැනැත්තකු වෙත ද, ඒ බලයලත් තැනැත්තා පනතේ IX වන කොටසේ හෝ පනතේ වෙනත් යම් කොටසක් යටතේ විධිවිධාන සලසා ඇති පරිදි, ඒ ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් යම් නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ඉල්ලා සිටීමට හෝ ලබා ගැනීමට හිමිකම් නොලැබිය යුතු ය.

10. බලය ලබාදීමේ නියමවල හෝ කොන්දේසිවල කවර හෝ නියමයක් හෝ කොන්දේසියක් බලයලත් තැනැත්තා විසින් උල්ලංඝනය කර ඇති බවට කොමිෂන් සභාව සෑහීමට පත්වන්නේ නම්, 6 වන නියෝගය යටතේ නිකුත් කරන ලද බලය ලබාදීමක්, කොමිෂන් සභාව විසින් අවලංගු කරනු ලැබිය හැකි ය.

## IV වන කොටස

### ශ්‍රී ලංකා රුපියල්වලින් ගෙවීම් කරන ලද අලෙවි කළ හැකි ඉඩම් පැවරීම, බදු දීම හෝ කුලියට දීම

11. බද්දට දීම හෝ පැවරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රුපියල්වලින් ගෙවීම් කරන ලද අලෙවි කළ හැකි යම් ඉඩම්, පනතේ 39 වන වගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි නැවත තුන්වන පාර්ශ්වයකට පවරන, බදුදෙන හෝ කුලියටදෙන තැනැත්තකුට හෝ සමාගමකට, නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් එසේ ලැබෙන මුදල් ප්‍රමාණය ඒ තැනැත්තාගේ හෝ සමාගමේ නමින්, ශ්‍රී ලංකාව තුළ කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශයෙන් පිටත, බලපත්‍රලාභී වාණිජ බැංකුවක පවත්වාගෙන යන නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

## V වන කොටස

### සිල්ලර වෙළෙඳ පහසුකම් භාවිත කිරීම

12. ශ්‍රී ලංකාවේ පුරවැසියකු හෝ වාසිකයකු විසින් අදාළ ගෙවීම් ශ්‍රී ලංකා රුපියල්වලින් ගෙවීමෙන්, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ බලයලත් තැනැත්තකු විසින් සපයනු ලබන සිල්ලර වෙළෙඳ පහසුකම් භාවිත කළ හැකි ය.

13. 12 වන නියෝගය යටතේ බලයලත් තැනැත්තකු විසින් ලබාගන්නා මුදල් ප්‍රමාණ, බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හරහා යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකට පරිවර්තනය කිරීම හෝ ඒ බලයලත් තැනැත්තාගේ සාමාන්‍ය ව්‍යාපාර කටයුතු කරගෙන යාමේ දී භාවිත කිරීම කරනු ලැබිය හැකි ය.

14. 12 වන නියෝගයේ සඳහන් සිල්ලර වෙළෙඳ පහසුකම්වලට හෝ සේවාවලට, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ තීරුබදු රහිත සිල්ලර වෙළෙඳ පහසුකම් හෝ සේවා ඇතුළත් නොවිය යුතු ය.

## VI වන කොටස

### අන්තර්කාලීන පියවර

15. (1) යම් බලයලත් තැනැත්තකු විසින්, පනතේ විධිවිධානවලට යටත්ව, 2026 මැයි මස 26 වන දිනය තෙක්, කොළඹ වරාය නගරයේ බලප්‍රදේශයෙන් පිටත ශ්‍රී ලංකාවේ යම් නම් කරනු ලබන ස්ථානයක සිට ව්‍යාපාර කටයුතු කරගෙන යනු ලැබිය හැකි ය.

(2) (1) වන අනුනියෝගයේ සඳහන් යම් ව්‍යාපාරයක්, සියලු කාර්ය සඳහා කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ පිහිටා ඇති සහ ඒ බල ප්‍රදේශය තුළ සහ එහි සිට ව්‍යාපාර කටයුතුවල නිරතවන ව්‍යාපාරයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ ව්‍යාපාරයකට දෙනු ලබන සියලු වරප්‍රසාදවලට හිමිකම් ලැබිය යුතු ය. තව ද, ඒ ව්‍යාපාරය පනතේ විධිවිධානවලට සහ ඒ යටතේ සාදනු ලබන යම් නියෝගවලට යටත් විය යුතු ය.

## VII වන කොටස

### අර්ථ නිරූපනය

16. මේ නියෝගවල -

''පනත'' යන්නෙන්, 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත අදහස් වේ;

''කොමිෂන් සභාව'' යන්නෙන්, පනත යටතේ පිහිටුවන ලද කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව අදහස් වේ;

''තීරුබදු රහිත සිල්ලර වෙළෙඳ පහසුකම් හෝ සේවා'' යන්නෙන්, කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද තීරුබදු රහිත බලපත්‍රයක් සන්තකයෙහි දරන බලයලත් තැනැත්තකු විසින් සපයනු ලබන සිල්ලර වෙළෙඳ පහසුකම් හෝ සේවා අදහස් වේ;

''අලෙවි කළ හැකි ඉඩම්'' යන්නෙන්, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ පිහිටා ඇති රජයේ අලෙවි කළ හැකි ඉඩම් සහ ව්‍යාපෘති සමාගමේ අලෙවි කළ හැකි ඉඩම් අදහස් වේ;

''වාසික'' යන්නට, පනතේ ඊට ලබා දී ඇති අර්ථය ම තිබිය යුතු ය.

''නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම'' යන්නෙන්, 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද, 2022 අංක 6 සහ 2022 අංක 7 දරන ශ්‍රී ලංකා මහ බැංකු විධාන ප්‍රකාරව විවෘත කර පවත්වාගෙන යනු ලබන විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හැර, බලපත්‍රලාභී වාණිජ බැංකුවක් සමග ආයෝජකයකු විසින් පවත්වාගෙන යන විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් අදහස් වේ; සහ

''සිල්ලර වෙළෙඳ පහසුකම්'' යන්නෙන්, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ ඇති භෝජනාගාර, සිනමාහල්, විනෝදාත්මක පහසුකම්, සාප්පු සවාරි පහසුකම් සහ වාහන ගාල් කිරීමේ පහසුකම් අදහස් වේ.

EOG - 07-0033

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.